වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2022

හින්දු සංස්කෘතික අරමුදල
இந்துப் பண்பாட்டு நிதியம்
Hindu Cultural Fund





හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்
Department of Hindu Religious and Cultural Affairs



බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசன, மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs

වාර්ෂික කාර්යසාධන වාර්තාව
2022

හින්දු සංස්කෘතික අරමුදල



හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අන්තර්ගතය

1. හැඳින්වීම 1

1.1 අරමුදලේ අරමුණ 1

1.2 අරමුදලේ බලතල, යුතුකම් සහ කාර්යයන් 1

1.3 ආණ්ඩුකාර මණ්ඩලය 2

2. සංවිධාන සටහන 3

3. 2022 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය 4

4. මූල්‍ය 6

5. 2022 වර්ෂය සඳහා වන ප්‍රවර්ධන සැලසුම 6

6. ප්‍රගතිය සහ අනාගත දැක්ම 10

7. විගණන වාර්තාව 12

1. හැඳින්වීම

හින්දු සංස්කෘතික අරමුදල 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනත මගින් හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු ස්වාධීනව ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව පිහිටුවන ලදී.

1.1 අරමුදලේ අරමුණු

හින්දු සංස්කෘතික අරමුදලේ අරමුණු අතර පහත කරුණු ඇතුළත් වේ.

- හින්දු කෝවිල් සහ හින්දු ආයතනවලට අදාල ක්‍රියාකාරකම්වල ඉදිරි ගමන සඳහා මූල්‍ය සහ වෙනත් ආධාර සැපයීම හා අදාල ප්‍රගතිය නිරීක්ෂණ කිරීම.
- හින්දු කෝවිල් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූල්‍ය ආධාර සහ වෙනත් ආධාර සැපයීම.
- හින්දු ආගම සම්බන්ධ අධ්‍යයන සහ පර්යේෂණ සඳහා මූල්‍ය සහ වෙනත් ආධාර සැපයීම.
- වෙනත් හින්දු ආගමික හෝ සංස්කෘතික අරමුණු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.

1.2 මණ්ඩලයේ බලතල, රාජකාරි සහ කාර්යයන්

a. අරමුදල් රැස් කිරීමට මුදල් හෝ ද්‍රව්‍ය වශයෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින්,

b. යම්කිසි මිල දී ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, අන්තිම කැමැත්ත පරිදි පවරා දීමක් හෝ වෙනත් ආකාරයකින් එයට පැවරිය හැක, චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට හෝ තබා ගැනීමට සහ අරමුදලේ නීතිරීතිවලට යටත්ව, විකිණීම, ප්‍රදානය කිරීම, ප්‍රකාශ කිරීම, සැලසුම් කිරීම, පැවරීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඇප කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම.

c. හින්දු ආගමේ සහ සංස්කෘතියේ උන්නතිය සඳහා ප්‍රදර්ශන, දේශන, සමුළු, වැඩමුළු, පන්ති, විවාද, සම්මන්ත්‍රණ, චාරිකා, විනෝද චාරිකා හෝ වෙනත් ඕනෑම කටයුත්තක් සංවිධානය කිරීම, පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම;

d. ආගමික හා සංස්කෘතික තරඟ පැවැත්වීම සහ ඕනෑම හින්දු සංගමයකට, එහි සාමාජිකයෙකුට හෝ එවැනි තරඟයකට සහභාගී වන වෙනත් ඕනෑම පුද්ගලයෙකුට ත්‍යාග, සහතික සහ වෙනත් පිළිග ැනීම් ප්‍රදානය කිරීම;

e. මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් ලිඛිතව බලය පවරන ලද නිලධාරීන් සහ සේවකයන් හෝ නියෝජිතයන් හරහා සෘජුව හෝ ඇතුල්වීමට හෝ ඉටු කිරීමට, එහි බලතල, කර්තව්‍ය සහ රාජකාරි ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලුම ගිවිසුම් සහ අරමුදලේ අරමුණු ඉටු කිරීම

f. මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීමට;

g. මෙම පනතේ විධිවිධානවලට යටත්ව, අරමුදලේ නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ යොදවා ගැනීම සහ වේතන ලබා දීම සහ එහි සේවකයින් පත් කිරීම, උසස් කිරීම, වේතනය සහ විනය පාලනය සහ ඔවුන්ට නිවාඩු සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධයෙන් නීති රීති සකස් කිරීම


h. අරමුදලේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් නීති රීති පැනවීම සහ අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය යැයි මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් සාක්ෂාත් කරගත හැකි දේවල් සිදු කිරීම

1.3 පාලක මණ්ඩලය

හින්දු සංස්කෘතික අරමුදල පාලනය කරනු ලබන්නේ පාලක මණ්ඩලයක් මගිනි. නිල බලයෙන් යුත් සාමාජිකයින් තිදෙනෙකු සහ අනෙකුත් සාමාජිකයින් පස් දෙනෙකු ගරු ඇමතිතුමා විසින් 2022 වර්ෂය සඳහා පාලක සභා සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබේ.

1.	සෝමරත්න විදානපතිරණ මහතා	- සභාපති
2.	වයි. අනිරුත්තනන් මහතා	- ප්‍රධාන පරිපාලන නිලධාරී
3.	ශාන්ති නවුකරසන් මහත්මිය	- සාමාජික
4.	පී. සුන්දරලිංගම් මහතා	- සාමාජික
5.	ඩී.ඩී. සුබ්‍රමනියන් මහතා	- සාමාජික
6.	දේශමාන්‍ය දොරයිසාමි විග්නේෂ්වරන් මහතා	- සාමාජික
7.	ඒ.පී. ජෙයරාජා මහතා	- සාමාජික
8.	කේ. හේමලෝජිනි මහත්මිය සහ වී. ඩිරෝෂණ මහත්මිය	- සාමාජික - ගණකාධිකාරී, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2. සංවිධාන සටහන


සභාපති
සාමාජික
සාමාජික
සාමාජික
ප්‍රධාන පරිපාලන නිලධාරී
සාමාජික
සාමාජික
සාමාජික
පරිපාලන නිලධාරිනි
ගණකාධිකාරි
ගිණුම් සහකාර
කළමනාකරණ සේවා නිලධාරි

Expenditure			Income		
Details	Year ended 31.12.2022 (Rs.)	Year ended 31.12.2021 (Rs.)	Details	Year ended 31.12.2022 (Rs.)	Year ended 31.12.2021 (Rs.)
Financial Assistance to Hindu Aranery Schools	1,500,000.00	1,500,000.00	Government Grant	400,000.00	400,000.00
Financial Assistance to Hindu Institutions & Hindu Public	5,250,000.00	0.00	Grant from Thirumurikandy Pillaiyar Temple	12,000,000.00	5,500,000.00
Financial Assistance to Hindu Temples	1,000,000.00	3,500,000.00	Interest from Fixed Deposit	4,602,225.52	1,919,191.02
Gurupooja expenses	0.00	306,540.00	Book Sale profit	380,061.73	3,399.60
Printing of Books for Hindu Public	0.00	0.00	Book sale (Aranery)	423,444.00	17,865.00
Purchase of lamp Chain & other Expenses	0.00	48,934.00	Donation for Hindu Education	130,000.00	10,000.00
Navalar mahanadu Expenses	672,801.00	0.00			
Administrative Expenses	67,979.00	72,870.00			
Depreciation Expenses	241,826.80	200,993.70			
Maintenance Expenses	103,891.00	0.00			
Cheque book charges	1,500.00	0.00			
Income Over Expenditure	9,097,733.45	2,221,117.92			
	17,935,731.25	7,850,455.62		17,935,731.25	7,850,455.62

Prepared by:

Checked by:

Accountant
Hindu Cultural Fund

V. Diroshana
Accountant
Department of Hindu Religious and Cultural Affairs,
248-1/1, Galle Road, Colombo-04.

Chief Administrative Officer
Hindu Cultural Fund

Y. Aniruthanan
Director
Department of Hindu Religious and Cultural Affairs
248-1/1, Galle Road, Colombo - 04.

Chairman
Hindu Cultural Fund

Somarathne Vidanapathirana
Secretary
Ministry of Buddhashasana
Religious & Cultural Affairs
8th Floor, "Sethsiripaya"
Battaramulla

Liabilities	Note	As at 31.12.2022 (Rs.)	As at 31.12.2021 (Rs.)	Assets	Note	As at 31.12.2022 (Rs.)	As at 31.12.2021 (Rs.)
Equity & Liability				**Non Current Assets**			
Surplus from Fund in Resource	1	39,392,352.93	37,171,947.75	Digital Photocopier		0.00	52,785.00
Income Over Expenditure	2	9,097,733.45	2,221,117.92	Speaker System		0.00	13,049.50
FD Interest surplus (Through Jounal)	3	0.01	(712.74)	Projector		0.00	63,000.00
				Micro Phones		9,608.77	20,091.07
				Laptop		264,510.00	367,020.00
					4	274,118.77	515,945.57
				Stock			
				Books **(Note 5)**	5	6,330,454.42	3,622,006.69
				Investments			
				Fixed Deposits Bank of Ceylon, Milagiriya	6	35,550,624.51	33,674,237.01
				Current Assets			
				Interest Receivable B.O.C	7	3,798,434.45	1,148,007.38
				Cash Account	8	2,536,454.24	432,156.28
		48,490,086.39	39,392,352.93			48,490,086.39	39,392,352.93

The board of directors and/or other governing body of an entity is responsible for the preparation and presentation of its Financial Statements.
The directors /members of the governing body should sign Financial Statements which should also contain a statement of responsibility.

Prepared by:

Checked by:

Accountant
Hindu Cultural Fund

V. Diroshana
Accountant
Department of Hindu Religious
and Cultural Affairs,
248-1/1, Galle Road, Colombo-04.

Chief Administrative Officer
Hindu Cultural Fund

Y. Aniruthanan
Director
Department of Hindu Religious
and Cultural Affairs
248-1/1, Galle Road, Colombo - 04.

Chairman
Hindu Cultural
Fund

Somarathne Vidanapathirana
Secretary
Ministry of Buddhashasana
Religious & Cultural Affairs
8th Floor, "Sethsiripaya"
Battaramulla

4. මූල්‍ය

2021.12.31 දිනට හින්දු සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය.

අනු අංකය	විස්තර	මුදල
1.	ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු	**රු 35, 550,624.51**
2.	මුදල් පොතේ ශේෂය	**රු 2,536,454.24**

5. 2022 වර්ෂය සඳහා වූ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

හින්දු සංස්කෘතික අරමුදල විසින් සිදු කරනු ලබන හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු 2022 වර්ෂය තුළ හින්දු සංස්කෘතික අරමුදලේ අරමුණුවලට අනුකූලව, ආණ්ඩුකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් හින්දු සංස්කෘතික අරමුදලෙන් සිදු කර ඇත.

අ) හින්දු ආයතන කෝවිල් සහ හින්දු දහම් පාසල ප්‍රතිසංස්කරණය කිරීමට මූල්‍ය ආධාර ලබා දීම.

ආ) යාපනයේ නාවලර් සංස්කෘතික ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම.

ඇ) හින්දු ආගමික අධ්‍යාපනය, සංස්කෘතිය ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.


ඈ) හින්දු දහම් පාසල් (අරනෙරි පාසල්) සිසුන් ගුරුවරුන් සහ මහජනතාගේ ප්‍රයෝජනය සඳහා පොත් මුද්‍රණය කිරීම.

අ) හින්දු ආයතන කෝවිල් සහ හින්දු දහම් පාසල ප්‍රතිසංස්කරණය කිරීමට මූල්‍ය ආධාර ලබා දීම.

(**i**) පහත සඳහන් හින්දු දහම් පාසල්වලට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ප්‍රතිපාදන ලබා දෙන ලදී.

අනු අංකය	ලියාපදිංචි අංකය	දහම් පාසලේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	මුදල
1	HA/07/56/22/54	ශ්‍රී සිත්ති විනායගර් අරනෙරි පාසල	මුසලි	රු 500,000.00
2	HA/07/56/24/02	ඉලෙයමලෙයග අරනෙරි පාසල	කොටපොළ	රු 500,000.00
3	HA/07/56/14/66	පේරුකට්ටි ශ්‍රී සිත්ති විනායගර් අරනෙරි පාසල	ඩෙලෆ්ට්	රු 500,000.00
				රු 1,500,000.00





ශ්‍රී සිත්ති විනායගර් අරනෙරි පාසල





ඉලයමලයග අරනෙරි පාසල

අනු අංකය	**ලියාපදිංචි** අංකය	කෝවිලේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	මුදල
1	HA/6/NE/422	ශ්‍රී සිවහාමි සමේද සුන්දරෙෂ්වරර් කෝවිල	නුවරඑලිය	රු 500,000.00
2	HA/5/MU/82	පේරාරු අසයලයගල විනායගර් කෝවිල	ඔට්ඩිසුට්ටාන්	රු 500,000.00
				රු1,000,000.00



ශ්‍රී සිවහාමි සමේද සුන්දරෙෂ්වරර් කෝවිල

(iii) පහත සඳහන් ආයතනවලට ප්‍රතිසංස්කරණ කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් මූල්‍යාධාර ලබා දීම

අනු අංකය	ලියාපදිංචි අංකය	ආයතනයේ නම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	මුදල
1.	HA/4/PUT/05	පුත්තලම හින්දු මහා සභාව	පුත්තලම	500,000.00
2.	HA/4/JA/337	සිවභූමි ළමා නිවාස	නල්ලූර්	250,000.00
3.	HA/4/MAT/15	රාමක්‍රිෂණ මිෂන් ළමා නිවාසය	මාතල	250,000.00
4.	HA/4/AM/79	අම්මන් කාන්තා නිවාසය	අලෙයඩි වේම්බු	250,000.00
				1,250,000.00



පුත්තලම හින්දු මහා සභාව

ආ) යාපනය නාවලර් සංස්කෘතික ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම

අනු අංකය	ආයතනයේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	මුදල
1.	නාවලර් සංස්කෘතික ශාලාව	යාපනය	2,000,000.00
			2,000,000.00



නාවලර් සංස්කෘතික ශාලාව

ඇ) හින්දු අධ්‍යාපනය සහ හින්දු ආගමික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම

හින්දු ආගමික, අධ්‍යාපනික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් හින්දු ජනතාව, හින්දු අරණෙරි පාසල් ගුරුවරුන් සහ සිසුන් සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.


ඇ) හින්දු ආගමික අධ්‍යාපනය, සංස්කෘතිය ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම

අනු අංකය	විස්තරය	ස්ථානය	මුදල
01.	හින්දු ගුරුකුලම් උපකාර වැඩ සටහන්	උතුරු පළාත	300,000.00
02.	හින්දු මහජනතාගේ අධ්‍යාපන ක්‍රියාකාරම්	උතුරු පළාත	1,000,000.00
03.	අරනෙරි ගුරුවරුන් හා සිසුන් සඳහා ධාරිකා වර්ධන වැඩ සටහන	උතුරු පළාත	200,000.00
04.	සංස්කෘතික වැඩ සටහන් පැවැත්වීම හා කලාකරුවන්ට සම්මාන ප්‍රදාන කිරීම	උතුරු පළාත	500,000.00
	එකතුව		2,000,000.00


ඈ) හින්දු ආගම ප්‍රවර්ධනය කිරීමේ අරමුණකින් හින්දු මහජනතාව, හින්දු අරෙනරි පාසල් සිසුන් හා ගුරුවරුන් ගේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් පොත් මුද්‍රණය කර ඇත.

අනු අංකය	**පොතේ නම**	**පියපත් ගණන**	**මුදල**
1	තිරුවාසග පුශෙ විති	100	28,500.00
2	පුට්ප විති	100	30,500.00
3	කොන්රෙයි වේන්දන්	100	30,500.00
4	තිරුසෙන්තිනිරෝට්ට කයමතවන්දා	100	32,400.00
5	නන්නෙරි	100	32,400.00
6	වාක්කුණ්ඩාම්	100	32,400.00
7	නල්වලි	100	38,000.00
8	ආත්තිසූඩි	100	38,000.00
9	තණිප්පමාලෙයි	100	40,000.00
10	ඊරෙලුපත්තු	100	42,800.00
11	සිවාලයදර්ශන විති	100	42,000.00
12	යාපනය සමයනිලෙයි	100	43,800.00
13	බාලපාඩම් (1 වැනි කොටස)	100	51,000.00
14	සිදම්බර මාන්මියම්	100	55,600.00
15	ඉල්ක්කණ විනාවිඩෙයි	100	61,000.00
16	තිරුමුරුකාට්ටුප්පරෙයි	100	69,000.00
17	තරුක්කසංකිරාගමුම් තරගසංගිර තීපියෙයුම්	100	69,000.00
18	ප්‍රෙයාග විවේකම්	100	83,400.00
19	ඉල්ක්කණ කෙත්තු	75	72,000.00
20	ශෙව විනාවිඩෙයි(11 වැනි කොටස)	75	78,750.00
21	බාලපාඩම් (3 වැනි කොටස)	75	79,200.00
22	කන්දපුරාණ සුරුක්කම්	75	96,450.00
23	කන්දපුරාණම් වසනම් -උරෙයි	75	100,875.00
24	ඉලක්කණ සුරුක්කම්	75	115,500.00
25	පෙරියපුරාණ සුසනම්	75	125,250.00
26	තිරුවිලෙයියාඩල් පුරාණම්	75	128,250.00
27	කෝවිල්පුරාණම්	75	131,100.00
28	සේතුපුරාණම්	75	261,600.00
29	ශෙවසමයනෙරි	75	137,500.00

30	ආරුමුගනාවලර් පිරපන්ද තිරට්ටු	75	144,750.00
31	පෙරියපුරාණම් වසනම්	75	144,750.00
32	අරට්පා අගත්තියර් තේවාර තිරට්ටු	75	150,000.00
33	බාලපාඩම් (4 වැනි කොටස)	75	159,000.00
34	සුඩාමනි නිකණ්ඩු -මුලමුම් උරෙයියුම්	40	95,600.00
35	නන්නූල් විරුත්තියුරෙයි	40	99,600.00
36	තිරුකෝවෙයාර්	40	99,600.00
37	තිරුකුරල් මූලමුම් පරිමේලලගර් උරෙයුම්	40	183,000.00
38	නන්නූල් කාණ්ඩිකයි ඔරෙයි	40	101,200.00
39	කන්ද පුරාණ මූලම්	40	104,400.00
			3,428,675.00


ஔவையார் அருளிச்செய்த
கொன்றை வேந்தன்
ஆறுமுகநாவலர் உரை
சிவாலயதரிசனவிதி
ஆறுமுகநாவலர்
திருவாசக பூசாவிதி
ஆறுமுகநாவலர்
கம்பர் இயற்றிய
ஏரெழுபது
&
திருக்கைவழக்கம்
ஆறுமுகநாவலர் பதிப்பு
ஸ்ரீலஸ்ரீ ஆறுமுகநாவலர் 200 ஆண்டு நிறைவு
இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்


பெரியபுராண சூசனம்
ஆறுமுகநாவலர்
திருவிளையாடற்புராண வசனம்
ஆறுமுகநாவலர்
பாலபாடம் - முதல் புத்தகம்
ஆறுமுகநாவலர்
யாழ்ப்பாணச் சமயநிலை
ஆறுமுகநாவலர்
ஸ்ரீலஸ்ரீ ஆறுமுகநாவலர் 200 ஆண்டு நிறைவு
இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்


இலக்கணச் சுருக்கம்
ஆறுமுகநாவலர்
திருமுருகாற்றுப்படை
ஆறுமுகநாவலர் உரை
கந்தபுராணச் சுருக்கம்
ஆறுமுகநாவலர்
கோயிற்புராணம்
உமாபதிசிவாசாரியர் அருளிச்செய்தது
உரை: ஆறுமுகநாவலர்
ஸ்ரீலஸ்ரீ ஆறுமுகநாவலர் 200 ஆண்டு நிறைவு
இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்

6. ප්‍රගතිය සහ අනාගත දැක්ම

ආර්ථික අස්ථාවරත්වය විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ ගත කළ වසරක් වන 2022 වර්ෂය සඳහා හින්දු සංස්කෘතික අරමුදලේ (HCF) වාර්ෂික කාර්ය සාධන වාර්තාවට මෙම පණිවිඩය එක් කිරීමට ලැබීම සතුටට කරුණකි. හින්දු සංස්කෘතික අරමුදල් ආණ්ඩුකාරක මණ්ඩලය විසින් 2022 දී එහි අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලකිය යුතු ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක කර ඇත. ඉතාමත් පසුගාමී ප්‍රදේශවල පිහිටි හින්දු දහම් පාසල් සංවර්ධනයට සහ හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය සඳහා 2022 දී අත්‍යවශ්‍ය මුදල් වෙන් කරන ලද අතර, හින්දු ජනතාවගේ ප්‍රයෝජනය සඳහා පොත් ගණනාවක් ද ප්‍රකාශයට පත් කරන ලද්දේ එම තීරණයට අනුව ය.

හින්දු සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් විසින් කරන ලද ඉල්ලීම් අනුව, ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර්ගේ 200 වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් ශ්‍රී ලංකා රජය විසින් 2022 වසර ''නාවලර් වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ''නාවලර් වර්ෂය. සැමරීම සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ හින්දු සංස්කෘතික අරමුදල එක්ව වැඩසටහන් රැසක් සංවිධානය කරන ලදී. විශේෂයෙන්ම 'ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර්ගේ සේවා මැයෙන් දේශීය විදේශීය විද්වතුන්ගේ සහභාගීත්වයෙන් දින පහක පර්යේෂණ සමුළුවක් යාපනයේදී සාර්ථකව පවත්වන ලදී. තවද, ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් විසින් රචනා කරන ලද පොත් 39 ක් 2022 දී හින්දු සංස්කෘතික අරමුදල හරහා නැවත මුද්‍රණය කර ඇත. මේ අතර, මේ අතර 2022 වසරේ පැවති තත්ත්වය හේතුවෙන් හින්දු සංස්කෘතික අරමුදල සඳහා කොඩි දිනය වැනි අරමුදල් රැස්කිරීමේ ව්‍යාපෘති සැලසුම් කළ පරිදි සිදුකිරීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක වූයේ තිරුමුරිකන්ඩි පිල්ලයාර් කෝවිල්වලින් එකතුවෙන් උපයාගත් ආදායමක් සහ හින්දු සංස්කෘතික අරමුදලේ ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලියෙන් උපයාගත් ආදායමකින් අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

අධ්‍යාත්මික සංවර්ධනය තුළින් දැහැමි, විනයගරුක සහ නීතිගරුක සමාජයක් ගොඩනැගීම අරමුණු කරගත් රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුකූලව හින්දු සංස්කෘතික අරමුදල ඉදිරියට යාමට සූදානම් වේ මෙම ඉලක්කයට අනුගත වෙමින්, හින්දු සංස්කෘතික අරමුදලේ වැදගත් ජනවරම වන්නේ හින්දු ආගමික අධ්‍යාපනය හින්දූන් අතර, විශේෂයෙන්ම හින්දු දරුවන් අතර සදාචාරාත්මක හා ආගමික වටිනාකම් ප්‍රගුණ කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීමයි. තවද, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2024 දී විවිධ හින්දු ආගමික හා සංස්කෘතික ප්‍රවර්ධනය සඳහා කටයුතු සිදු කිරීමට හින්දු සංස්කෘතික අරමුදල් සැලසුම් කරයි. එමෙන්ම හින්දු දහම් අධ්‍යාපන සංවර්ධනයට අදාළ කටයුතු සහ හින්දු සංස්කෘතික අරමුදල් සඳහා අරමුදල් රැස්කිරීමේ කටයුතු සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදීමට සැලසුම් කර ඇත.

අවසාන වශයෙන්, 2022 වර්ෂයේදී හින්දු සංස්කෘතික අරමුදලෙහි සියලු ජයග්‍රහණ සඳහා හින්දු සංස්කෘතික අරමුදලෙහි සැලසුම් සහගත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුලලේ ආණ්ඩුකාර මණ්ඩලයයේ මගපෙන්වීම, සහයෝගය සහ නිරන්තර දිරිගැන්වීම වෙනුවට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.



වයි. අනිරුත්තනන්
ප්‍රධාන පරිපාලන නිලධාරි,
හින්දු සංස්කෘතික අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. සිඑඒ/සි/එච්සිඑල්/2022/එෆ්ඒ

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූනි 19 දින

සභාපති
හින්දු සංස්කෘතික අරමුදල

හින්දු සංස්කෘතික අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හින්දු සංස්කෘතික අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදලේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව		නිරීක්ෂණ
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ,		
	(i)	38(ඊ) සහ 40 වගන්ති	විගණනය කරනු ලබන අස්ථිත්වයක ගණන්දීමේ නිලධාරියා විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් අරමුදල සම්බන්ධ්‍යයන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
	(ii)	41(1) වගන්තිය	විගණන හා කලමනාකරණ කමිටු පත්කර ඒ අනුව අරමුදලේ ක්‍රියාකාරිත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
	මුදල් රෙගුලාසි 751 හා 763		මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.6,330,454 ක වටිනාකමකින් යුත් විකිණීමේ පදනමින් තබා ගෙන ඇති පොත්වලට අදාළව තොග පොත් පවත්වා නොතිබුණි.
(ඇ)	අංක 01/2020 හා 2020 අගෝස්තු 08 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය		වාර්ෂිකව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය එම අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙල කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුවේ. එසේ වුවද,ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

හින්දු සංස්කෘතික අරමුදලේ කාර්යයන් ඉටු කිරීමට අදාලව පිළියෙල කර තිබූ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් හින්දු අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු සහ හින්දු ආගමික කටයුතු ප්‍රවර්ධනයට අදාලව එකතුව රු. මිලියන 16 ක් වෙන් කර තිබුණද රු.මිලියන 3.4 ක් වැය කර හින්දු ආගමික පොත් මුද්‍රණය සඳහා පමණක් කටයුතු කර තිබුණි.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ලේඛනය අනුව කොඩි සහ පොත් අලෙවියෙන් පිළිවෙලින් රු.මිලියන 5ක සහ රු.මිලියන 2.8 ක ආදායමක් ලබා ගැනීමට ඇස්තමේන්තුගත කර තිබුණද, පොත් අලෙවියෙන් රු.මිලියන 1.5ක ආදායමක් පමණක් උපයා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හින්දු කෝවිල්වල ඉදිකිරීමේ වැඩසටහන් 14 ක් සඳහා රු. මිලියන 7.75 ක් ගෙවීම් කර තිබුණද ඊට අදාල ඇස්තමේන්තු, රිසිට්පත් සහ වැඩ අවසන් කිරීමේ සහතික ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට ද ක්‍රියා කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න

විගණකාධිපති



හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்

Department of Hindu Religious and Cultural Affairs